ශීර්ෂය **187** - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

## **1.** මූල්‍ය ප්‍රකාශන

### **1.1** මතය

ශීර්ෂය 187 - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### **1.2** මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### **1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයකට සහ මූලධන වැය විෂයයන් 03 කට සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුවෙන් වෙන් කළ එකතුව රු.2,750,000 ක ප්‍රතිපාදනයෙන් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි. තවද, 187-2-4-5-1409 පුනරාවර්තන වැය විෂයය සඳහා වෙන් කළ රු.50,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබුණේ රු.129,245 ක් එනම් සියයට 0.2 ක් පමණි. | පිළිගන්නා ලද බව. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රජාවගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරිම අරමුණු කරගෙන 2021 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ උද්‍යාන 2 ක්, යාපනය සහ මන්නාරම යන ප්‍රදේශවල, උතුරු නැගෙනහිර සංවර්ධන, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර තිබුණ අතර කලින් කල අමාත්‍යාංශ 11 ක් යටතේ පවත්වාගෙන ආ මෙම තාක්ෂණික උද්‍යාන 2022 ජූලි 22 දිනැති අති විශේෂ ගැසට්පත්‍ර අංක 2289/43 ප්‍රකාරව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට පවරා තිබුණි. තොරතුරු තාක්ෂණ උද්‍යාන සඳහා නිශ්චිත කාර්යය මණ්ඩලයක් හඳුනා ගෙන නිසි අනුමැතිය ලබා ගෙන නොතිබුණද යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානයට කාර්යය මණ්ඩලය වශයෙන් 47 දෙනෙකුද මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යානයට කාර්යය මණ්ඩලය 12 දෙනෙකුද බඳවා ගෙන තිබුණි. එසේ වුවද ප්‍රවර්තන වර්ෂය වන විට යාපනය හා මන්නාරම තොරතුරු තාක්ෂණ | 2023 ඔක්තෝබර් 25 දින තොරතුරු තාක්ෂණ උද්‍යාන, වෘත්තීය පුහුණු අධිකාරිය වෙත පවරා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් රාජ්‍ය ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් වෘත්තීය පුහුණු අධිකාරියේ උප සභාපති සමඟ පවත්වන ලදී. ඒ අනුව මෙම තොරතුරු තාක්ෂණ උද්‍යානය වෘත්තීය පුහුණු අධිකාරිය වෙත පැවරිමට කටයුතු කරමින් පවතින බැවින් යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානයේ කාර්යයභාර නිලධාරීගේ ඉල්ලීම පිළිබඳ පියවර ගැනීම ප්‍රමාද කළ බව. | තොරතුරු තාක්ෂණ උද්‍යානවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අමාත්‍යාංශය පූර්ණ අධීක්ෂණයක් සිදු කළ යුතු අතර අවශ්‍ය කටයුතු සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

උද්‍යාන සඳහා කාර්ය මණ්ඩලය පිළිවෙලින් 7 දෙනෙකු හා 6 දෙනෙකු දක්වා අඩු වී තිබුණි. බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර නොතිබීම හේතුවෙන් යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විධායක නිලධාරි තනතුර සඳහා සංවර්ධන නිලධාරි සේවයේ දෙවන ශ්‍රේණියේ නිලධාරියකු බඳවා ගෙන තිබුණි. කෙසේ වෙතත් මෙම උද්‍යානවල පවතින සේවක පුරප්පාඩු, සිසුන් ආකර්ෂණය කිරීමේ වැඩසටහන් හා නව පාඨමාලා හඳුන්වා දීම පිළිබඳව අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානය යටතේ සහතිකපත්‍ර පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා 11 කට සහ මාර්ගගත හා අන්තර්ජාල තාක්ෂණය පිළිබඳ වැඩමුළු 3 කට සිසුන් 320 ක් ලියාපදිංචි කිරීමට සැලසුම් කර තිබුණද පාඨමාලා 2 කට හා එක් වැඩමුළුවකට ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව 43 ක් එනම් සියයට 13 ක් විය. 2020 වර්ෂයේ සිට ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 126 සිට 2023 වර්ෂය වන විට 43 දක්වා ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව තවදුරටත් නිරීක්ෂණය විය. එසේම මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යානය යටතේ පාඨමාලා 10 ක් සඳහා අපේක්ෂිත සිසුන් සංඛ්‍යාව 300 ක් වුවද පාඨමාලා 3 ක් සඳහා ලියාපදිංචි වී තිබුණු සිසුන් සංඛ්‍යාව 155 ක් විය. යාපනය හා මන්නාරම උද්‍යාන දෙකෙන් අපේක්ෂිත පාඨමාලා ගාස්තු ආදායම පිළිවෙලින් රු.1,129,000 ක් හා රු.2,185,000 ක් වුවද ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව අඩු වීම හේතු කොට ගෙන රාජ්‍ය ආදායමට එකතු කර ගත හැකිව තිබුණේ යාපනය උද්‍යානයෙන් රු.131,080 ක්ද මන්නාරම උද්‍යානයෙන් රු.833,500 ක්ද වශයෙන් විය. මෙම උද්‍යාන නඩත්තුව හා පාඨමාලා පැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂයේදී යාපනය හා මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යාන සඳහා වැය කර තිබුණු පිරිවැය පිළිවෙලින් රු.6,330,201 ක් හා රු.4,999,863 ක් විය. ඒ අනුව උද්‍යාන දෙක සිසුන් 198 දෙනෙකුගෙන් එකතු කළ ආදායමට වඩා රු.10,365,484 ක් වැඩියෙන් වැය කර තිබුණි.

තොරතුරු තාක්ෂණ උද්‍යාන ඵලදායි ලෙස කරගෙන යාමට හැකියාව ඇති වෘත්තීය පුහුණු අධිකාරිය වැනි ආයතනයක් වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බවත්, සිසුන්ගේ යොමුවීම වඩාත් පවතින්නේ පිළිගැනීම ඉහළ ආයතන වෙත බව.

- එම-

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිනෙන් දින ඉහළ යන ඉඩම් ඉල්ලුමට සරිලන පරිදි කොළඹ නගරය පුළුල් කිරීම සඳහා කොළඹ වරායට යාබද ඉඩම් ගොඩකිරීමේ යෝජනාවක් වශයෙන් කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිමය වෙනස්වීම් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘති සමාගම විසින් ඇ.ඩොලර් මිලියන 143 ක වන්දි මුදලක් ඉල්ලුම් කර තිබුණු අතර ඒ වෙනුවට හෙක්ටයාර් 2 ක වාණිජමය ඉඩමක් ව්‍යාපෘතිය සමාගමට ලබා දී තිබුණි. මෙම ඉඩමේ තක්සේරු වටිනාකම වාර්තා කර නොතිබුණු අතර වන්දි මුදල හෝ ඉඩමේ වටිනාකමින් රජයට අලාභයක් සිදු වී තිබුණි. | මේ සඳහා අංක PMO/06/03/CM/70/2016 හා 2016 ජූලි 14 දිනැති කැබිනට් සංදේශය හේතු වී ඇති බව. | ලංකා රජයට අලාභයක් නොවන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | වරාය නගරයේ අපජලය කළමනාකරණය සඳහා ස්ථිර විසඳුමක් සපයන තුරු තාවකාලික විසඳුම සඳහා අපේක්ෂිත වියදම රු.මිලියන 1,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද සැලස්මේ වෙනස් කිරීම් හා මිල ගණන් ඉහළ යාම් හේතුවෙන් ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 3,700 දක්වා වැඩි වී තිබුණි. මෙම කාර්යය කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වූ ත්‍රෛපාර්ශවීය ගිවිසුම් ප්‍රකාරව 2019 වර්ෂයේදී අවසන් විය යුතු වුවත් ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර තිබුණේ 2022 දෙසැම්බර් මසයේදීය. 2017-2019 කාලය තුළදී රු.මිලියන 1,600 ක මුදලක් මහා භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණද 2023 සැප්තැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබුණි. එසේම, රු.මිලියන 2,900 ක මුළු පිරිවැයකට ඇස්තමේන්තු කර තිබුණු ස්ථිර විසඳුමේ කාර්යයද 2022 වර්ෂයේදී සම්පූර්ණ කළ යුතු වුවද 2023 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර නොතිබුණි. 2022 වර්ෂය වන විට තාවකාලික හා ස්ථිර විසඳුම් දෙකම ආරම්භ කර නොතිබුණ හෙයින් ස්ථිර විසඳුම ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශයේ අවධානය යොමු කර නොතිබීමෙන් තාවකාලික විසඳුමට වැය කරන රු.මිලියන 3,700 රජයට සිදු වන පාඩුවක් බව නිරීක්ෂණය විය. | වසර 2020 හා 2021 තුළ පැවති කොවිඩ් වසංගතය හා ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හෝ ඒ සඳහා මුදල් වෙන් කිරීමට නොහැකි විය. එහි කටයුතු 2022 දෙසැම්බර් මාසයේ දී ආරම්භ විය. සැලැස්මේ වෙනස්කම් හා මිල ගණන් ඉහළ යාම මත ව්‍යාපෘතියේ පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 1,000 සිට රු.මිලියන 3,700 ක් දක්වා වැඩි වී තිබෙන බව. තාවකාලික විසඳුමක් ලෙස කොළඹ මහ නගර සභාවේ දකුණු ප්‍රදේශයේ දැනට පවතින අපජල මාර්ගයට සම්බන්ධ පොම්පාගාර හා නල අළුත්වැඩියා කිරීම මගින් වරාය නගරයේ අපජල පහසුකම් අවශ්‍යතාවයෙන් දිනකට ඝන මීටර 5000 ක ප්‍රමාණයක් සපුරා ගත හැකි බැවින් දකුණු අපජල සම්බන්ධතාවය යථාවත් කරන අතරම, උතුරු අපජල සම්බන්ධතා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය විය. එමෙන්ම උතුරු අපජල සම්බන්ධතාවය වසර 3 ක කාලයක් තුළ නිම කිරීමට | රු.මිලියන 1,000 ක් යටතේ තාවකාලික විසඳුම 2019 වර්ෂයේදී නිම කිරීමට 2020 හා 2021 තුළ පැවති කොවිඩ් වසංගතය හා ගෝලීය ආර්ථික අර්බුදය බලපෑමක් කර නොතිබුණි. ත්‍රෛපාර්ශවීය ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තීරණය කිරීමට ද මෙය හේතු විය. | |
| (ඇ) | ත්‍රෛපාර්ශවීය ගිවිසුමෙහි 24.1.2 ඡේදය ප්‍රකාරව, හෙක්ටයාර් 91 ක් වූ පොදු ඉඩම් ප්‍රමාණය තුළ වූ වරාය නගරයේ මුහුදු වෙරළ ප්‍රදේශය ශ්‍රී ලංකා රජය සතු විය යුතු වුවත් ව්‍යාපෘති සමාගම විසින් මුහුදු වෙරළ ප්‍රදේශයට අයත් ඉඩම්, අවන්හල් කිහිපයකට තාවකාලිකව කුලියට දීමට කටයුතු කර එම අවන්හල්වලින් ආදායම් එකතු කර ගෙන තිබුණි. | විවිධ ව්‍යාපාරික කටයුතු උදෙසා බිම් කොටස් වෙන් කර දීම ව්‍යාපෘති කළමනාකරණ අංශයට අයත් කාර්යයක් නොවන අතර එය කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව සතු කාර්යයකි. කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය ඉදිකිරීම් භූමියක් ලෙස පවතින අතර සියලුම නඩත්තු හා අදාළ කටයුතු කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘති සමාගම මඟින් සිදු කරනු ලබන අතර ඒ සම්බන්ධ කිසිදු පිරිවැයක් නොදරයි. එබැවින් මෙම ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම ව්‍යාපෘති සමාගම විසින් එකතු කරනු ලැබේ. | ත්‍රෛපාර්ශවීය ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ත්‍රෛපාර්ශවීය ගිවිසුමෙහි උපලේඛන අංක 10 අනුව, වාණිජමය ඉඩම්, පොදු ඉඩම් සහ මාර්ග සඳහා වූ ඉඩම් ඇතුළුව ඉඩම් කොටස් 118 ක වැඩබිම් වැඩි දියුණු කිරීම 2019 සැප්තැම්බර් 16 දින වන විට අවසන් කළ යුතු වුවත් 2023 සැප්තැම්බර් 30 දින වන විට ඉඩම් කොටස් 85 කට පමණක් අවසන් කිරීමේ සහතික ලබා දී තිබුණි. තවද, මාර්ග, පාලම් හා උමං මාර්ග 2020 මාර්තු 14 දින වන විට අවසන් කළ යුතු වුවද, 2023 සැප්තැම්බර් 30 දින වන විට සියයට 50 ට වැඩි ප්‍රතිශතයකින් නිම කර තිබුණු අතර ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි. 2020 මාර්තු 09 අවසන් කළ යුතු භූමි අලංකරණ කටයුතුද 2023 නොවැම්බර් 30 දින වන විටත් අවසන් කර තිබුණේ සියයට 77 ක් පමණි. අදියර 7 කින් නිමකිරීමට සැළසුම් කර තිබුණු දකුණු මලාපවාහන මාර්ගය නිම කිරීම 2023 ජූලි 11 සිදු කල යුතු වුවද 2023 සැප්තැම්බර් 30 වන විටත් එහි අදියර තුනක් සැළසුම් අදියරේ පැවතුනි. | සමාගම විසින් නිසි ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ අමාත්‍යාංශය යන ආයතන දෙකම ඉතිරි ඉඩම් කට්ටි සඳහා නිම කිරීමේ සහතිකය නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව හා ව්‍යාපෘතියේ කාලසටහන අනුව කොවිඩ් 19 වසංගතය හා ආර්ථික අභියෝගයන් වැනි බාහිර සාධකවලින් බලපෑම් එල්ල වූ අංගයන් ද ආවරණය කරමින් වසර 08 ක් තුළ ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට අපේක්ෂා කරයි. | -එම - |
| (ඉ) | ත්‍රෛපාර්ශ්වික ගිවිසුමට අනුව පොදු ඉඩම්, අලෙවි කළ හැකි ඉඩම් (GOSL) හා අලෙවි කළ හැකි ඉඩම් (ව්‍යාපෘති සමාගම) සඳහා වෙන් කළ යුතු ඉඩම් ප්‍රමාණය පිළිවෙලින් 91, 62 හා 116 ක් වූ අතර වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය 93.65 ක්, 60.85 ක් හා 118.16 ක් වශයෙන් වූ බැවින් වැඩියෙන් වෙන් කර තිබුණු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 3.66 ක් විය. | උපලේඛන 14 හි ඡේද 10 හා 11 හි දැක්වුණේ අමතර භූමිය වෙන් කරනු ලබන ක්‍රමවේදය යි. උපලේඛන 14 හි පළමු ඡේදයෙහි දැක්වුණු ඉඩම් ලබාගැනීමේ ක්‍රමවේදයේ අමතර භූමිය ශ්‍රී ලංකා රජය හා ව්‍යාපෘති සමාගම අතර සාධාරණ ලෙස | -එම - |

| | | | |
|---|---|---|---|
| | | බෙදීම සඳහා අවස්ථාව සලසා තිබූ බව. | |
| (ඊ) | ටෙක්නෝ පාර්ක් ඩිවෙලොප්මන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ් සමාගම 2021 සැප්තැම්බර් 29 දින රජයේ සම්පූර්ණ කොටස් හිමි සමාගමක් වශයෙන් සංස්ථාපනය කර තිබුණි. මෙම සමාගම අංක 2289/43 හා 2022 ජූලි 14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. ආරම්භයේදී අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර තිබුණද එහි සාමාජිකයින් වරින් වර ඉල්ලා අස්වීම හේතුවෙන් ක්‍රියාකාරී මට්ටමේ නොතිබුණි. සංගමික ව්‍යවස්ථාවලියෙහි 43(i), (iii) & (iv) සහ 43(2) වගන්ති ප්‍රකාරව සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තවද, සංගමික ව්‍යවස්ථාවලියෙහි 43(5) වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තා පිළියෙළ කර නොතිබුණි. | ටෙක්නෝ පාර්ක් ඩිවෙලෝප්මන්ට් පුද්ගලික සමාගම සඳහා සභාපතිවරයකු හා අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් පත් කරන ලෙස මෙම අමාත්‍යාංශය විසින් ජනාධිපති ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කරන ලද බව සහ දැනට අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් පත් කර ඇති බව. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත්වීම නිසා සමාගමක් ලෙස ක්‍රියාකාරීත්වයක් නොපවතින බැවින් වාර්ෂික වාර්තා පිළියෙල කර ගැනීමට නොහැකි වී ඇති බව. | අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 6.6 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු අතර සංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | ගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන සඳහා ඉඩම් අක්කර 31 රූඩ් 02 පර්චස් 23 ක් හා අක්කර 50 ක් ලබා ගන්නා ලෙස 2021 අප්‍රේල් 08 හා 2021 ජූනි 17 දිනැති ජනාධිපති ලේකම්ගේ ලිපි මගින් දන්වා තිබුණද ඉන් ලබා ගෙන තිබුණේ ගාල්ල සඳහා අක්කර 29 රූඩ් 03 පර්චස් 7.15 ක් සහ කුරුණෑගල සඳහා අක්කර 20 ක් පමණි. තවද, කුරුණෑගල ඉඩමෙහි පිහිටා තිබෙන නිවාස දෙක සඳහා විකල්ප ඉඩම් ලබාදීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙහි අධීක්ෂණය යොමුව නොතිබුණි. | 2021 අප්‍රේල් 08 දිනැති ජනාධිපති ලේකම් කාර්යාලයේ ලිපියෙන් අක්කර 31 රූඩ් 02 පර්චස් 23 ක් අත්පත් කර ගන්නා ලෙස දන්වා තිබුණද, අක්මීමන ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නිකුත් කරන ලද සන්තකය භාර දීමේ සහතිකය අනුව තාක්ෂණ අමාත්‍යාංශයට භාර දී ඇත්තේ අක්කර 29 රූඩ් 03 පර්චස් 7.15 ක් පමණක් බව. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට අදාළව නවතම තොරතුරු සහ නිවාස දෙක ඉදිකිරීම සඳහා විකල්ප ඉඩම් ලබා දීමේ තොරතුරු මෙම අවස්ථාවේ අමාත්‍යාංශය සතුව නොමැති අතර කුරුණෑගල ප්‍රදේශීය ලේකම් කාර්යාලයෙන් තොරතුරු සොයා බලන ලෙස අමාත්‍යාංශයේ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බව. | අදාළ වෙනස්කම් වලට හේතු විමසා බැලිය යුතුය. |
| (ඌ) | ගාල්ල තාක්ෂණික උද්‍යානයේ ඉංජිනේරු උපදේශකට 2022 අප්‍රේල් මස සිට රු.18,173,751 ක් කුරුණෑගල උද්‍යානයේ ඉංජිනේරු උපදේශකට 2023 දෙසැම්බර් 31 දිනට රු.36,188,088 ක් සහ ගාල්ල උද්‍යානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට 2022 මාර්තු 31 දින රු.950,601,926 ක් ගෙවීමට තිබුණි. | මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයෙන් බිල් පත් ලැබී ඇති බව හා 2022 වර්ෂයේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉල්ලා අස්වීමත් සමඟ සමාගමේ ක්‍රියාකාරීත්වය නැවතීම මේ සඳහා හේතු වී ඇති බව | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ගෙවීම් පිළිබඳව තහවුරු කිරීම් ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | ගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන 2021 වසරේ ආරම්භ කර වසර 2 ක් ගත වී තිබුණද භෞතිකව පරීක්ෂාව සිදු කළ 2024 පෙබරවාරි 05 දින වන විටත් ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. මෙම ප්‍රමාද කිරීම හේතුවෙන් ගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන කොන්ත්‍රාත් ගිවිසුම්වල 14.6 වගන්ති ප්‍රකාරව කොන්ත්‍රාත්තුව ප්‍රමාද කිරීම මත පිළිවෙලින් රු.236,355,010 ක් හා රු.416,802,172 ක් ප්‍රමාද ගෙවීම් ලෙස ටෙක්නෝ පාර්ක් ඩිවෙලොප්මන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ් සමාගම විසින් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව රජයට සිදුවී ඇති පාඩුව රු.653,157,182 ක් විය. | ව්‍යාපෘතිය සක්‍රිය වූයේ 2022 අප්‍රේල් දක්වා පමණි. රාජ්‍ය වියදම් පාලනය පිලිබඳ මුදල් අමාත්‍යාංශයේ අංක 03/2022 හා 2022 මාර්තු 26 දිනැති අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල් නොමැතිකම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අත්හිටුවන ලදී. තවද, ටෙක්නෝ පාර්ක් ඩිවලෝප්මන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2022 අගෝස්තු 25 දින ඉල්ලා අස්විය. ඒ අනුව ව්‍යාපෘතියේ කිසිදු කටයුත්තක් සිදු වී නොමැති බව. ව්‍යාපෘති සමාගම විසින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ප්‍රමාද කිරීම සඳහා පොලිය ඉල්ලා ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඒ) | නුවරඑළිය හා නුවර යෝජිත තාක්ෂණික උද්‍යාන ඉදිකිරීම් කටයුතු සඳහා තෝරාගෙන තිබුණු සමාගම 2021 නොවැම්බර් 16 හා 2022 පෙබරවාරි 24 දින ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කර තිබුණද එහි ඉදිකිරීම් කටයුතු වාර්තා කරන දිනය වන විටත් කටයුතු ආරම්භ කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | ව්‍යාපෘති වාර්තාවෙහි කාල රාමුවට අනුව කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය වෙත වෙනත් රජයේ ආයතන වෙතින් ලබා දී තිබුණු වාහන 16 ක් අමාත්‍යාංශයට පවරා ගැනීමකින් සහ ලියාපදිංචි අයිතියකින් තොරව 2023 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජන කරමින් පැවතුණි. ඒ අනුව කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා විසින් නිකුත් කළ 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 ට පටහැනිව වත්කම් භාරයේ තබා ගෙන තිබුණි. | ගරු රාජ්‍ය අමාත්‍යතුමාට භාවිතයට සුදුසු වාහනයක් අමාත්‍යාංශය සතුව නොමැති වීම මත ඉන් එක් වාහනයක් මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් විසින් ගරු රාජ්‍ය අමාත්‍යතුමා ලබා දී ඇති බව සහ අමාත්‍යාංශය විසින් භාවිතා කරන වාහන විධිමත්ව අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |